# බස් මාමා



අමාදී ශාක්‍යා රණධීර

# බස් මාමා

අමාදී ශාක්‍යා රණධීර

2025.01.01

# පිදුම

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

හිමිදිරි උදේ දුම් කේතලේ හඬ ඇසෙන විට මා නැගිට්ටේ අම්මා කොහේදැයි බලමින් ය. සීතල හිරිගඬු පිපී සිටී මම අම්මා ගෙනත් දුන් තේ කෝප්පෙන් උණුසුම් වීමි. සතියේ දිනක් බැවින් මා විගස මුහුණ අතපය සෝදා සුදු ඇඳුමින් සැරසුනි. කොන්ඩ කරල් දෙක බැඳ පාසල් යෑමට නිවසින් පිටත් වුණි.

වේගයෙන් පැමිණි බස් රථයට ගොඩවුණු මම ඉක්මණින් පාසල කරා යෑමට සිතා ගත්තේමි. අධික වේගයෙන් ධාවනය වන බසයේ තොරතොන්චියක් නැතිව කැසට් යන්ත්‍රයේ හඬ මහත් හිසරදයක් විය. මීදුම අතරින් ගමන් කරන බස් රථය කොහේ යන්නේදැයි මට සිතාගත නොහැකි විය. බසය වේගයෙන් දුවන්නේ ඊයේ යෑමට

තිබුණ ගමනත් අද යනවා මෙනි. මා ගිය බස් රථයේ මගීන් බොහෝ දෙනෙකු සිටියහ. බස් රථයෙහි විශාල ශබ්දයක් ඇසීමත් සමඟ මට කිසිවක් මතක නැති විය.

අම්මාගේ කටහඬ යාන්තමින් ඇසෙත්ම මම ආයාසයෙන් ඇස් ඇරීමට උත්සහ කළෙමි. මට දැනුණේ පුදුම වේදනාවකි.

මා සිටියේ සෙනඟ පිරුණු ශාලාවකය. “මගේ දුවේ නැඟිටින්න... නැඟිටින්න...” කියා කෑගසන හඬට මට පියවී සිහිය ලැබුවෙමි.

“මොකද අම්මේ වුණේ...”

“නෑ මගේ පුතේ ඔයාට කොහොමද?” අම්මා ඇසීය.

බසයේ සිටි මා රෝහලක ඇඳක්

මත ඉන්නවා දැනුණ විට මට එය

අදහාගත නොහැකි විය.

වාට්ටුව තුලදී මහා අදෝනා හඬක්

ඇසිය.මගේ ඇඳේ එහා පැත්තේ

කුඩා දරුවෙකු කිහිලි ගන්වාගෙන

මැදිවියේ කාන්තාවකි. ඇයගේ

අදෝනාව මුළු වාට්ටුව පුරා

පැතිරියයි.

“මගේ මහත්තයෝ මේ මොකද වුණේ...” ඈ කෑමොර දෙයි.

හෙද නෝනා කෙනෙක් පැමිණ මා පරීක්ෂා කර බැලීය. “දුවට කම්පනය වගේ.”

“මොකද වුණේ දුව...” ඇය විමසීය.

මම හිස වැනුවෙමි. එහෙත් මට දැනුණේ පුදුම වේදනායකි.

“දුව ඉස්කොලේ යන්න නැග්ග
බස් එක වැලි ටිපර් රථයක
හැප්පිලා අඩි ගාණක් පහළට බසය
පෙරළිලා. ගොඩක් අයට අමාරුයි.
දුව  බේරුණේ පෙර පිනකට.
පොඩි එවුන් අහිංසක මල් වගේ.”
මට රියදුරු මාමා ගැන පුදුම
තරහක් ආවේ. උදේ ඉක්මනට
ඉස්කොලේ යන්න නැග්ග බසය

නිසා අන්තිමට ඉස්පිරිතාලේ. පුදුම වේගයෙන් ගියේ.

මා සුව වී ගෙදර යාමට එළියට එන විට මා දුටුවේ ඇස් අදහාගත නොහැකි දෙයකි. රෝද පුටුවක අතක් බෙල්ලේ එල්ලා ගෙන බලාගත් අත බලා සිටි බස් රියදුරු මාමා ය.

එදා තිබූ ශක්තිය අද ඔහු තුළ නොදැක්කේ ය. සදාකාලික ඔත්පල බස් මාමා බලාගත් අත බලා සිටීම මගේ හිතට මහත් දුකකි. ඔහුට ඉවසීම තිබුණේ නම් ජීවිත කීයක් බේරෙනු ඇතිද... ඒ බසයට කුමක් වී ඇත් ද... මෙවැනි අනතුරුවලින් කී දෙනෙකු දුක් විඳිනවා ද...

මම අම්මාගෙන් ඇසුවා මට කුමක්වී ද යන්න.

අම්මා මට කීවා “බස් රථය අඩි ගාණක් පහළට වැටුණා. බස් රථයේ සිටි මගීන්ව එළිය ගද්දි වැඩි දෙනෙකුට තුවාල ඇතිවෙලා තිබුණා. ඔයාවත් එළියට ගද්දි සිහිය තිබුණේ නෑ.” අම්මා පැවසුවා.

අපව බේරාගැනීමට උත්සහ කළ ගමේ උදවිය අපගේ දෙමාපියන්ට වහා දුරකථන ඇමතුමක් දී ඔවුන්ව දැනුවත් කර තිබුණා.

නිමි

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්